# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1776/40 - 2012 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා - 2012.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1934 පෙබරවාරි මස 05 වැනි දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ 1972 මැයි මස 05 වැනි දින දරන සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ නිවේදනය.

නිවේදනය

කලින් කල සංශෝධිත 1934 පෙබරවාරි මස 05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:43 අ වගන්තියට ඉනික්බිතිව පහත දැක්වෙන අතුරු වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ව්‍යවස්ථා සංග්‍රහය වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති යම් රාජ්‍ය සේවකයකු විශ්‍රාම වැටුප් ලබමින් සිටින අවස්ථාවේදී, එම විශ්‍රාමික පුද්ගලයා වෙත ගෙවන ලද යම් වැඩිපුර මුදලක්/පාරිතෝෂිකයක්/විශ්‍රාම වැටුපක්/හිඟ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් නොඑසේ නම් වෙනත් වැඩිපුර වූ විශ්‍රාම වැටුප් ගෙවීමක් වෙතොත් එවැනි වැඩිපුර ගෙවීමක් විශ්‍රාම වැටුපෙන් අඩු කර ගත යුතු ය."

මෙම නිවේදනයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට කරන ලද සංශෝධනය 1934 පෙබරවාරි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ක් වූ අගෝස්තු මස 29 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,

10-349